# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව. | செயலகம், கொழும்பு 01. இலங்கை | The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: FP/06/100/05/01/2016
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2015.12. 31

**රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක: 01/2010 (i)**

කොමසාරිස් ජනරාල්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
අධ්‍යක්ෂ ජනරාල්, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

**2016 - අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම**
**ජාතිය ගොඩනැගීමේ බදු ආදායම පළාත් සභාවලට මාරු කිරීම**

2010.12.29 දිනැති අංක 01/2010 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛය අනුව 2% ක අනුපාතයකින් යුතුව රැස් කරනු ලබන ජාතිය ගොඩනැගීමේ බද්දෙන් 1/3 ක් පළාත්සභා වලට මාරු කරනු ලැබේ.

2. කෙසේ වුවද, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද 2016 අයවැය යෝජනා වලට අනුව, ජාතිය ගොඩනැගීමේ බදු අනුපාතය 2% සිට 4% දක්වා වැඩි කිරීමට යෝජනා කර ඇති අතර එම බදු අනුපාතය ඉහළ දැමීමෙන් ජනනය වනු ලබන මුළු ආදායම ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වේ.

3. ඒ අනුව, 2016.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි 4% ක අනුපාතයකින් යුතු ජාතිය ගොඩනැගීමේ බද්දෙන් රැස් කරගනු ලබන මුළු ආදායමෙන් 1/6 ක් පළාත් සභාවලට මාරු කළ යුතුය. තවද, අංක 01/2010 දරන චක්‍රලේඛයෙහි 2 (ආ) ඡේදයෙහි සඳහන් අනුපාතයන් පරිදි ජාතිය ගොඩනැගීමේ බදු ආදායම අදාළ පළාත් සභාවලට මාරු කිරීම කළ යුතු වේ.

4. ඉහත සඳහන් චක්‍රලේඛයෙහි සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසම පවතී.

ආර්.එච්.එස්. සමරතුංග
භාණ්ඩාගාර ලේකම්

පිටපත්:
1. විගණකාධිපති
2. ලේකම්, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය
3. පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
4. අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
5. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
7. ලේකම්, මුදල් කොමිසම
8. සාමාන්‍යාධිකාරී, ලංකා බැංකුව
9. සාමාන්‍යාධිකාරී, මහජන බැංකුව